දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 23/2017(I)

PH/CF/CA/2/BUDGET/APACACC/2017,

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2017-12-29

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම මාණ්ඩලික නිලධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්.

2017 වර්ෂය සඳහා ගිණුම් පියවීම

උක්ත කරුණ සම්බන්ධව මාගේ සමාංක හා 2017-12-07 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 23/2017 චක්‍රලේඛයට අමතරවයි.

02. ඉහත චක්‍රලේඛයේ 02. i ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතුය.

"2017-12-30 වන සෙනසුරාදා දින සියළුම බන්ධනාගාර ආයතනයන් හා පුහුණු පාසල විසින් එදින ප.ව. 1.00 ට මුදල් පොත් පියවීමට කටයුතු කල යුතුවේ. එබැවින් ගිණුම් අංශ නිලධාරීන් මෙන්ම ගිණුම් පියවීමට බලයලත් නිලධාරීන් ගිණුම් පියවීම් අවසන් වන තෙක් ආයතනය තුල එදිනට රැදී සිටීමට වග බලා ගත යුතුවේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව උප ආයතන රාශියකින් සමන්විත වන බැවින් හා ගිණුම් පියවීම ඉතා සංකීර්ණ වන බැවින් ද මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කල යුතුවේ."

03. චක්‍රලේඛයේ 02. iii ඡේදය සඳහා පහත පරිදි සංශෝධන අතුලත් විය යුතුය.

**"2017-12-30 දින මුදල් පොත පියවා, ශේෂය පියවීම වෙනුවෙන් ලියන ලද අවසන් චෙක්පත 2018-01-02 දින පෙ.ව. 10.00 ට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ නිල බැංකු ගිණුමට(7041491) බැර කල යුතුවේ. සියළුම ආයතන විසින් 2017-12-30 දින ගිණුම් පියවීමෙන් අනතුරුව චෙක්පතේ ඡායා පිටපත හා 2017-12-30 දින වන විට වියදම් වාර්තාවක්, ආවරණ ලිපිය සමග විද්‍යුත් තැපැල (commfinance@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එදිනම එවීමට කටයුතු කල යුතුය. මුදල් පොතේ ශේෂයක් නොමැති නම් ඒ පිළිබඳව ද, ලිඛිතව දැනුම් දීමට ඉහත පරිදි කටයුතු කල යුතුය. "**

එච්.එම්.එන්.සී. ධනසිංහ,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ - 09.**

පිටපත:- 01. විගණකාධිපති - දැ.ගැ.පි